**කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

**වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය**

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍යය) උපාධි පළමු පරීක්ෂණය (බාහිර) - 2021

ඔක්තෝම්බර් - 2023

## BMGT E1025 - ව්‍යාපාර ගිණුම්කරණය

ප්‍රශ්න සංඛ්‍යාව : පහයි (05) කාලය : පැය 03 යි

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

වැඩසටහන්ගත නොකළ ගණකයන්ත්‍ර පමණක් භාවිතා කළ හැකිය.

### ප්‍රශ්න අංක 01

අ) තනි පුද්ගල ව්‍යාපාරයක පහත දැක්වෙන ගණුදෙනු පහක් (05) මගින් මූලික ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම ඔබට සපයා ඇත ( වත්කම් = ප්‍රාග්ධනය + වගකීම් ). ඔබ විසින් පහත 1 සිට 5 දක්වා ඇති එකිනෙක සඳහා සිදුවිය හැකි ගණුදෙනුව ලියා දක්වන්න.

| | වත්කම් | | | | ප්‍රාග්ධනය | + | වගකීම් |
|---|---|---|---|---|---|---|---|
| | තොගය | වෙළඳ ණයගැති | මුදල් | = | | | වෙළඳ ණයහිමි |
| 1 | | | +1,000,000 | = | +1,000,000 | | |
| 2 | + 600,000 | | | = | | | + 600,000 |
| 3 | (500,000) | + 600,000 | | = | + 100,000 | | |
| 4 | | | (400,000) | = | | | (400,000) |
| 5 | | | (50,000) | = | (50,000) | | |

(ලකුණු 05)

ආ) දූල්ෂාන් ට්‍රේඩර්ස්, තනි පුද්ගල ව්‍යාපාරයක් වන අතර 2021 අප්‍රියෙල් 01 වන දින මුදලින් රු7,000,000/= ක් ආරම්භක ප්‍රාග්ධනය ලෙස ආයෝජනය කරමින් ආරම්භ කරන ලදී.

පහත සඳහන් අතිරේක තොරතුරු සපයා ඇත.

1. 2022 මාර්තු 31 න් අවසන් වන වසර සඳහා මුදල් පාලන ගිණුම ( මුදල් පොත) පහත පරිදි වේ.

**මුදල් පාලන ගිණුම ( මුදල් පොත)**

| | හර (රු.) | | බැර (රු.) |
|---|---|---|---|
| මුලික ප්‍රාග්ධන ආයෝජනය | 7,000,000 | වෙළඳ ණය හිමි ගෙවීම | 1,800,000 |
| අත්පිට විකුණුම් | 3,200,000 | අත්පිට ගැනුම් | 1,200,000 |
| වෙළඳ ණයගැති ලැබීම් | 2,400,000 | විදුලිය හා ජලය | 300,000 |
| | | කාර්යාල කුලී | 275,000 |
| | | යන්ත්‍ර මිලදී ගැනීම (2021 ඔක්තෝම්බර් 01 දින මිලදී ගන්න ලදී) | 2,500,000 |
| | | වැටුප් හා වේතන | 2,100,000 |
| | | ශේෂය ප/ගේ | 4,425,000 |
| | **12,600,000** | | **12,600,000** |
| ශේෂය ඉ/ගේ | 4,425,000 | | |

2. 2022 මාර්තු 31 දිනට ගිණුම් පොත් වල පහත සඳහන් ශේෂයන් දක්වන ලදී.

| | **Rs.** |
|---|---|
| වෙළඳ ණයගැති | 950,000 |
| වෙළඳ ණය හිමි | 940,000 |
| ගෙවිය යුතු විදුලිය හා ජල බිල්පත් | 29,000 |

3. ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ සරල මාර්ග ක්‍රමයට පිරිවැය මත වාර්ෂිකව 20% බැගින් යන්ත්‍ර සඳහා ක්ෂය ප්‍රතිපාදනය කිරීමයි.

4. 2022 මාර්තු 31 දිනට තොග කිසිවක් නොතිබුණි.

**ඔබ විසින්,**

2022 මාර්තු 31 දිනට දුල්ෂාන් ට්‍රේඩර්ස්හි ශේෂ පිරික්සුම පිළියෙළ කරන්න.

(ලකුණු 10)

**( මුළු ලකුණු 15)**

**ප්‍රශ්න අංක 02**

අන්සාරි ට්‍රේඩර්ස් තීන්ත නිෂ්පාදකයෙක් වන අතර පහත සඳහන් තොරතුරු 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පොත් වලින් උපුටා ගන්නා ලදී.

| **විස්තරය** | රු. |
|---|---|
| අමුද්‍රව්‍ය මිලදී ගැනුම් | 2,771,000 |
| අමුද්‍රව්‍ය ගෙන ඒමේ කුලී | 29,000 |
| සෘජු වේතන | 920,000 |
| රක්ෂණ | 328,000 |
| කම්හල් කලමකරුගේ වැටුප | 900,000 |
| විදුලිය | 420,000 |
| ක්ෂය - පිරියත හා යන්ත්‍ර | 450,000 |
| ක්ෂය - කම්හල් ගොඩනැගිල්ල | 180,000 |

පහත සඳහන් අතිරේක තොරතුරු සපයා ඇත.

1. තොග පහත පරිදි අගය කර තිබේ.

| **විස්තරය** | **2020 අප්‍රියෙල් 01 දිනට** රු. | **2021 මාර්තු 31 දිනට** රු. |
|---|---|---|
| අමුද්‍රව්‍ය | 900,000 | 875,000 |
| නොනිමි වැඩ (ප්‍රථමික පිරිවැයට අගය කර ඇත) | 175,000 | 420,000 |

2. පහත වියදම්, පහත පරිදි බෙදා වෙන් කල යුතු වේ.

| වියදම් | කම්හල | කාර්යාල |
|---|---|---|
| විදුලිය | 80% | 20% |
| රක්ෂණ | 60% | 40% |

3. නිෂ්පාදනය කරන ලද නිෂ්පාදිත, නිෂ්පාදන පිරිවැය මත 15% ක ලාභ අන්තිකයක් සහිතව වෙළඳ අංශයට මාරු කරනු ලැබේ.

**ඔබ විසින්,**

2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අන්සාරි ට්‍රේඩර්ස් නිෂ්පාදන පිරිවැය ලේඛනය ( නිෂ්පාදන ගිණුම ) පිළියෙළ කරන්න.

**( මුළු ලකුණු 15)**

**ප්‍රශ්න අංක 03**

2022 දෙසැම්බර් 31 දිනට සී/ස ඊ නෙට් පොදු සමාගමේ (Enet PLC) ශේෂ පිරික්සුම පහත දක්වා ඇත.

| | | හර | බැර |
|---|---|---|---|
| | | **Rs.'000** | **Rs.'000** |
| දේපළ, පිරියත හා උපකරණ<br>(2022 දෙසැම්බර් 31 දිනට පිරිවැය /ප්‍රත්‍යාගණන අගයට) | | | |
| ඉඩම් | | 340,000 | |
| ගොඩනැගිලි | | 102,560 | |
| පිරියත සහ යන්ත්‍ර | | 144,330 | |
| මොටර් වාහන | | 120,680 | |
| 2022 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්ෂය | | | |
| ගොඩනැගිලි | | | 34,260 |
| පිරියත සහ යන්ත්‍ර | | | 25,780 |
| මොටර් වාහන | | | 52,340 |
| ගොඩනැගිලි බැහැර කිරීමේ ගිණුම | | | 65,000 |

| | | | |
|---|---|---|---|
| කල්බදු වත්කම | | 2,400 | |
| 2022 ජනවාර 1 දිනට තොගය | | 5,600 | |
| වෙළඳ ලැබිය යුතු දෑ/වෙළඳ ගෙවිය යුත දෑ | | 14,560 | 12,350 |
| බැංකුවේ ඇති මුදල් | | 39,800 | |
| ප්‍රකාශ කළ ප්‍රාග්ධනය | | | 200,000 |
| 2022 ජනවාර 1 දිනට රඳවාගත් ඉපැයුම් | | | 191,132 |
| 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රත්‍යාගණන සංචිතය | | | 37,500 |
| 2022 දෙසැම්බර් 31 දිනට විලම්බිත බදු වගකීම | | | 24,300 |
| වර්ෂය සඳහා විලම්බිත බදු වියදම | | 3,700 | |
| මිලට ගැනුම්/විකුණුම් | | 589,430 | 780,970 |
| පරිපාලන වියදම් | | 45,300 | |
| බෙදාහැරමේ වියදම් | | 10,970 | |
| මූල්‍ය පිරිවැය | | 4,302 | |
| | | **1,423,632** | **1,423,632** |

අතිරේක තොරතුරු

1. 2022 දෙසැම්බර් 31 දිනට ඇති තොගවල පිරිවැය රු. 4,750,000 ක් විය. 2022 දෙසැම්බර් 31 දිනට පැවති තොගවල ශුද්ධ උපලබ්ධි අගය රු. 4,900,000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.
2. 2017 ජුලි 1 දින රු. මිලියන 80 කට මිලදී ගත් ගොඩනැගිල්ලක්, 2020 දෙසැම්බර 31 දින රු. මිලියන 70 කට ප්‍රත්‍යාගණනය කරන ලදී. 2022 දෙසැම්බර් 31 දින මෙම ගොඩනැගිල්ල රු. මිලියන 65 ක මිලකට විකුණනු ලැබීය. විකිණීමෙන් ලද මුදල් වාර්තා කිරීම හැරෙන්නට, සමාගමේ පොත්වල මෙම බැහැර කිරීම සම්බන්ධ කිසිවක් වාර්තා කර නොමැත.

   ඊ නෙට් සිය ගොඩනැගිලි ප්‍රත්‍යාගණන වටිනාකමට තබාගන්නා අතර ගොඩනැගිලි වර්ෂ 20 ක් පුරාවට ක්ෂය කරයි.

   පහත සඳහන් දෑ ගොඩනැගිල්ල ප්‍රත්‍යාගණනය සඳහා අදාළ වේ.

   - ගොඩනැගිල්ල වෙනුවෙන් හඳුනාගෙන ඇති සමුච්චිත ප්‍රත්‍යාගණන සංචිතය රු. මිලියන 4 කි.
   - මෙම ප්‍රත්‍යාගණනය නිසා පළමුව තක්සේරු කරන ලද ප්‍රයෝජනවත් කාලයේ වෙනසක් සිදු නොවූ අතර ඉන්පසු ප්‍රත්‍යාගණනයක් සිදු නොකරන ලදී.
3. පහත සඳහන් ගෙවිය යුතු දෑ ගිණුම්ගත කළ යුතුව ඇත.

විගණන ගාස්තු: රු. 1,200,000

2022 දෙසැම්බර් මාසය සඳහා උපයෝගිතා බිල්පත්: රු. 2,450,000

4. පහත තොරතුරු 2022 ජනවාරි 1 දින මූල්‍ය කල්බද්දක් යටතේ ඊ නෙට් විසින් මිලදී ගන්නා ලද යන්ත්‍රය සඳහා අදාළ වේ.

- ප්‍රයෝජනවත් ජීව කාලය: වසර 4 කි.
- යන්ත්‍රයේ සාධාරණ අගය: රු. 5,000,000
- අවම කල්බදු ගෙවීමේ වර්තමාන වටිනාකම (Present value of minimum lease payment) රු. 4,626,000
- කල්බදු ගිවිසුම යටතේ ගෙවිය යුතුව ඇති මුළු මුදල: රු. 6,000,000.
- කල්බද්ද තුළ ඇතුළත්ව ඇති ව්‍යාංග පොලී අනුපාතිකය වර්ෂයකට 15%

කල්බදු ගිවිසුම යටතේ රු. 1,200,000 ක් වහාම ගෙවීම අවශ්‍ය වූ අතර ඉතිරිය 2022 දෙසැම්බර් 31 වෙනිදායින් ආරම්භ කර සමාන වාර්ෂික වාරික හතරකින් ගෙවිය යුතුය.

වහාම කල ගෙවීම සහ 2022 දෙසැම්බර් 31 දින ගෙවූ පළමු වාරිකය කල්බදු වත්කමක් වශයෙන් වාර්තා කිරීම හැරෙන්නට මේ සම්බන්ධයෙන් කිසිවක් ඊ නෙට්ගේ පොත්වල වාර්තා කර නොමැත.

5. වර්ෂය සඳහා ආදායම් බදු ප්‍රතිපාදනය රු. 6,730,000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

අවශ්‍ය වන්නේ:

අ) 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය පිළියෙල කරන්න.

(ලකුණු 12)

ආ) 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය පිළියෙල කරන්න.

(ලකුණු 06)

ඇ) 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කරන්න.

(ලකුණු 16)

ඈ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අදාළ සටහන් සහ හෙළිදරව් කිරීම් දක්වන්න.

(ලකුණු 06)

**( මුළු ලකුණු 40)**

**ප්‍රශ්න අංක 04**

දමිත් සහ උදිත් ලාභ'ලාභ පිළිවලින් 2:1 අනුපාතයට බෙදාගනිමින් DU ෆැෂන් නම් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබයි. 2022 ජනවාරි 01 දින, රු. 8,000,000/- ක මූලික මුදල් ආයෝජනයක් සමඟ මීනා නව හවුල්කරුවෙකු වශයෙන් හවුල්ව්‍යාපාරයට ඇතුළත් විය.

I. පහත සඳහන් ශේෂයන් හවුල් ව්‍යාපාරයේ පොත් වලින් උපුටාගෙන තිබේ.

**(රු '000)**

| | හර | බැර |
|---|---|---|
| 2022 ජනවාරි 01 දිනට ප්‍රාග්ධන ගිණුම | | |
| දමිත් | | 12,000 |
| උදිත් | | 8,000 |
| 2022 ජනවාරි 01 දින මීනා රැගෙන ආ ප්‍රාග්ධනය | | 8,000 |
| 2022 ජනවාරි 01 දිනට ජංගම ගිණුම | | |
| දමිත් | | 1,500 |
| උදිත් | 800 | |
| 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී ගැනිලි | | |
| දමිත් | 900 | |

II. 2022 ජනවාරි 01 වන දින හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 2,400,000 කට අගය කරන ලද අතර එය කීර්තිනාම ගිණුමක් විවෘත නොකර හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම හරහා ගැලපීමට තීරණය කරන ලදී.

III. හවුල් ව්‍යාපාරයේ ජංගම නොවන වත්කම් 2022 ජනවාරි 01 වන දින පහත පරිදි ප්‍රත්‍යාගණනය කරන ලදී.

(රු.'000)

| | **2022 ජනවාරි 01 දිනට ප්‍රත්‍යාගණිත අගය** | **පිරිවැය** | **2022 ජනවාරි 01 දිනට සමුච්චිත ක්ෂය** |
|---|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 6,000 | 4,000 | 600 |
| මෝටර් වාහන | 1,400 | 2,000 | 1,000 |

ජංගම නොවන වත්කම්, ප්‍රත්‍යාගණිත අගයන් යටතේ හවුල් ව්‍යාපාරයේ ගිණුම් වල පවත්වාගෙන යාමට එකඟ වන ලදී.

IV. නව හවුල් ව්‍යාපාරයේ ගිවිසුමෙහි පහත සඳහන් දෑ ඇතුලත් වේ :

- 2022 ජනවාරි 01 වන දිනට ඇති ප්‍රාග්ධන ගිණුම්වල ශේෂයන් මත වාර්ෂිකව10% බැගින් වූ ප්‍රාග්ධන පොලියක් ගෙවනු ලැබේ
- උදිත්ට මාසිකව රු. 40,000.00 ක වැටුපක් ලැබීමට හිමිකම් ඇත
- දමිත්, උදිත් සහ මීනා අතර ලාභ'ලාභ පිළිවලින් 4:3:3 අනුපාතයට බෙදාගත යුතුය

V. 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ශුද්ධ ලාභය රු. 6,480,000 ක් විය.

ඔබ විසින් කළ යුතු දෑ ;

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත සඳහන් දෑ පිළියල කරන්න.

අ) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්

(ලකුණු 05)

ආ) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්

(ලකුණු 05)

**(මුළු ලකුණු 10)**

**ප්‍රශ්න අංක 05**

(අ) මූල්‍ය වාර්තාකරණය සඳහා වන සංකල්පීය රාමුවට අනුව, පොදු අරමුණු මූල්‍ය ප්‍රකාශනවල පරමාර්ථය වන්නේ ආයතනයට සම්පත් සැපයීම සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී පරිශීලකයින්ට ප්‍රයෝජනවත් මූල්‍ය තොරතුරු සැපයීමයි.

I. (i) ආයතනයක මූල්‍ය තොරතුරු භාවිතා කරන විවිධ පරිශීලකයින් දෙදෙනෙකු (02) දක්වන්න.

**(ලකුණු 01)**

(ii) ආයතනයක පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ සඳහා උදාහරණ දෙකක් (02) දක්වන්න.

**(ලකුණු 02)**

II. මූල්‍ය සඳහා සංකල්පීය රාමුවට අනුව වාර්තාකරණ අස්තිත්වය (Reporting Entity) යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න පැහැදිලි කරන්න

(ලකුණු 02)

(ආ) 2023 මාර්තු 31 දිනෙන් සහ 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන පහත සඳහන් මූල්‍ය ප්‍රකාශය **සීමාසහිත කේසන් සමාගමේ** මූල්‍ය පොත් වලින් උපුටා ගෙන ඇත.

**සීමාසහිත කේසන් සමාගම**

**2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ශය සඳහා**

**ආදායම් ප්‍රකාශයේ උද්‍ධෘතයන්**

| | රු '000 |
|---|---|
| විකුණුම් | 76,000 |
| විකුණුම් පිරිවැය | (49,400) |
| දළ ලාභය | 26,600 |
| පොලී හා බදුවලට පෙර ලාභය | 11,000 |
| පොලී වියදම | (2,600) |
| බදු පෙර ලාභයට | 8,400 |
| බදු පසු ලාභය | 7,140 |

**සීමාසහිත කේසන් සමාගම**

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

**(රු '000)**

| | **2023 මාර්තු 31 දිනට** | | **2022 මාර්තු 31 දිනට** | |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| දේපල, පිරියත සහ උපකරණ- ධාරණ අගයට | | 140,000 | | 132,000 |
| **ජංගම වත්කම්** | | | | |
| තොග | 41,000 | | 40,000 | |
| වෙළඳ ලැබිය යුතු මුදල් | 27,000 | | 22,000 | |
| මුදල් සහ මුදල් වලට සමාන දෑ | 7,200 | 75,200 | 6,400 | 68,400 |
| **මුළු වත්කම්** | | **215,200** | | **200,400** |
| **ස්කන්ධය සහ වගකීම්** | | | | |

| | | | | |
|---|---|---|---|---|
| **ස්කන්ධය** | | | | |
| ප්‍රකාශිත ප්‍රග්ධනය | | 100,000 | | 100,000 |
| රඳවාගත් ඉපැයීම් | | 45,000 | | 37,860 |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| දිගුකාලීන ණය | | 18,000 | | 24,000 |
| **ජංගම වගකීම්** | | | | |
| වෙළඳ ගෙවිය යුතු මුදල් | 35,700 | | 27,000 | |
| ගෙවිය යුතු ආදායම් බදු | 4,500 | | 5,500 | |
| උපචිත වියදම් | 12,000 | **52,200** | 6,040 | **38,540** |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | | **215,200** | | **200,400** |

සියළු විකුණුම් හා ගැනුම් ණය පදනම මත සිදුකරන බව උපකල්පනය කරන්න.

ඔබ විසින් කළ යුතු දෑ ;

**a)** ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා / අවසන් දිනට **සීමාසහිත කේසන් සමාගමේ** පහත සඳහන් අනුපාත **ගණනය කරන්න:**

(i) දළ ලාභ අනුපාතය

(ii) ජංගම අනුපාතය

(iii) ණයගැති එකතු කිරීමේ කාලය

(iv) ණයහිමි ගෙවීමේ කාලය

(v) තෝලන අනුපාතය

(ලකුණු 10)

**b)** **සීමාසහිත කේසන් සමාගමේ** පහත සඳහන් අනුපාත වැඩිදියුණු කරගත හැකි ආකාර දෙකක් (02) **සඳහන් කරන්න:**

(i) දළ ලාභ අනුපාතය

(ii) තෝලන අනුපාතය

(ලකුණු 05)

**(මුළු ලකුණු 20)**